රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 298

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1985 ජූලි මස 02 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**සියළුම මධ්‍යම මට්ටමේ කාර්මික නිලධාරීන්ගෙන් යැදි ඒකාබද්ධ කාර්මික සේවාවක් සඳහා ඇති අවශ්‍යතාවය ගැන විමසා වාර්තා කරනු පිණිස පත්කල නිල කමිටු වාර්තාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම.**

1978.10.31 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක.276 වද, 1983.06.03 වැනි දිනය දරණ ආයතන චක්‍රලේඛ ලිපි අංක.407 ට හා මධ්‍යම මට්ටමේ කාර්මික ඒකාබද්ධ සේවා ව්‍යවස්ථා සංග්‍රහයට (සියළුම මධ්‍යම මට්ටමේ කාර්මික නිලධාරීන්ගෙන් යැදි ඒකාබද්ධ කාර්මික සේවාවක් සඳහා ඇති අවශ්‍යතාවය ගැන විමසා වාර්තා කරනු පිණිස පත්කල නිල කමිටු වාර්තාවේ VII වන පරිච්ඡේදයේ 2:4(අ) අනුච්ඡේදයට) ඔබේ අවධානය යොමු කරමි.

02. මධ්‍යම මට්ටමේ කාර්මික ඒකාබද්ධ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 2:4(අ) වගන්තිය, පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ:-

"2:4(අ) අනුමත සේවක සංඛ්‍යාවෙන් 90% ක් පුරවන්නේ පහත දැක්වෙන පරිදි බඳවා ගැනීමෙනි.

(I) භාෂාව හෝ සාහිත්‍යය, ගණිතය සහ තවත් විද්‍යා විෂයයන් දෙකකින් සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය සමත්වූ අය අතුරින්

හෝ

(II) භාෂාව හෝ සාහිත්‍යය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකින් සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී, විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගය (සාමාන්‍ය පෙළ) සමත්වූ අය අතුරින්

හෝ

(III) පළමු භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකින් 'බී' ශ්‍රේණියේ සාමාර්ථයන් සහිතව විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගය සමත්වූ අය අතුරින්

2.....

සහ/හෝ

(iv) පිළිගත් කාර්මික ආයතනයක නියමිත පාඨමාලා හදාරා අවසන් කළ අය අදාළින්

සටහන:- ඉහත (ii) සහ (iii) යටතේ සුදුසුකම් ඇති අයදුම්කරුවන් නියමිත ශ්‍රේණියේ කාර්යයන් ඉටුකිරීම සඳහා අදාළ යයි ඒ ඒ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන විද්‍යා විෂය/විෂයයන්ගෙන් දෙපාර්තමේන්තුමය පරීක්ෂණයකටද පෙනී සිටිය යුතුවේ."

03. කරුණාකර, මධ්‍යම මට්ටමේ කාර්මික ඒකාබද්ධ සේවාවට අයත් තනතුරුවල බඳවා ගැනීමේ පරිපාටි මේ අනුව සංශෝධනය කිරීම පිළිබඳව කටයුතු කරන්න.

/අධ්‍යක්ෂ අධ්‍යක්ෂ.

6/19.